**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

--------------------------------------------------

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.2,102,060 ක්වූ මෝටර් රථය තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ප්‍රමිත 08 ප්‍රකාරව එම රථයේ ඵලදායි ජීවිත කාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම මේවන විට ආරම්භ කර ඇති අතර, ඉදිරි වර්ෂයේදී අදාල ගැලපුම් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. | සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් ප්‍රමිතය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ප්‍රමිත 20 හි 59 වන ඡේදය ප්‍රකාරව 1989 ට පෙර එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලැබී තිබුණු රු.547,885 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන අදාල වත්කමේ ඵලදායී ජීවිත කාලය තුල ක්‍රමානුකූල පදනමකින් ආදායමට ක්‍රමක්ෂය කර නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ අහාර හා කෘෂිකාර්මික සංවිධානය මගින් ලබාදුන් මූල්‍ය ආධාරයක් වන මෙම මුදල ඉදිරි වර්ෂයේදී ක්‍රමක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතය ප්‍රකාරව වත්කමේ ඵලදායී ජීවිත කාලය තුල ක්‍රමානුකූල පදනමකින් ආදායමට ක්‍රමක්ෂය කල යුතුය. |
| (ඇ) | ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රිය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2018 දෙසැම්බර් 31 දිනට වූ විශ්‍රාම වැටුප් වගකීම එවැනි ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව රු.66,508,205,596 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත .මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයුගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුය. |

### 1.5.2 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම අතිවිශේෂ ගැසට් පත්‍රය පරිදි ගොවීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කළද දායක මුදල් අයකර ගැනීම ඒ අනුව සිදුකර නොතිබීම නිසා 2017 හා 2018 වර්ෂ වලදී ගොවි දායකත්වය පිළිවෙලින් රු. 29,381,645 ක් හා රු.24,552,961 ක් වූ අතර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු.2,616,581,105 ක් හා රු.3,059,370,767 ක් වී තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහළ යාම නිසා 2017 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් රු. 2,520,000,000 ක් හා රු.2,725,000,000 ක් භාණ්ඩාගාරය මඟින් ලැබී තිබූ අතර භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී. | අංක 1853/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට කටයුතු කර ඇති අතර ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යා හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් එමගින් හඳුන්වාදෙන ලදී. ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වුවද විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ගොඩ නැගී ඇති විශ්‍රාම වැටුප් වගකීමට සාපේක්ෂව අරමුදල ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත දැනටමත් අවශ්‍ය වාර්තාවන් ඉදිරිපත් කර ඇති අතර, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමෙන් පසු අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යා හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදීයට යොමුව | අනුකූල නොවීම (රු) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත. | | | |
| 15 (2), (3) වගන්ති | යම් දායකයෙකු වෙත නිකුත් කර ඇති සහතික යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය. එවිට තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත අභියාචනයක් කිරීමේ අයිතිය දායකයෙකුට තිබිය යුතු අතර දායකයාට එසේ නොදැන්වීම හේතුවෙන් අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායක වී ඇති ගොවීන් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පැහැර හැරියහොත් ඔවුන්ගේ දායකත්වය අවලංගු වන අතර ඒ පිළිබඳව අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර ඇත. එසේ දායකත්වය අවසන් වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස 60 සම්පූර්ණ වන අවස්ථාවේදී ප්‍රතිපූර්ණය | ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් එම දායකයා වෙත නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාව මඟහැරී තිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 20 වගන්තිය | යෝජනා ක්‍රමයේ උපදේශක කාරක සභාව, සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2018 වර්ෂය වෙනුවෙන් සාමාජිකයන් නමදෙනෙකු පමණක් පත්කර තිබුණ අතර කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී පුරප්පාඩුව පවතින උපදේශක කාරක සභා සාමාජිකයින් සියළුම දෙනා පත්කිරීමෙන් අනතුරුව රැස්වීම් පැවැත්වීම ද නිසි පරිදි සිදුකිරීමට අපේක්ෂා කරනු ලබයි . | සාමාජිකයන් පත්කර නිසි පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු කලයුතුය. |
| 4 වගන්තිය | ගොවීන් හට තම වෘත්තීය කටයුතු කරගෙන යාමට නොහැකි ස්ථිර අර්ධ දුබලතාවයක් හෝ පූර්ණ දුබලතාවයක් වූ විට ආර්ථික වශයෙන් යම් පිටුවහලක් වීමට දීමනාවක් ගෙවීම, මරණයකදී මරණ පාරිතෝෂිකයක් ගෙවීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් ගෙවීම අරමුණ වේ. එසේ වුවත් 2012 වර්ෂයෙන් පසුව සාමාජිකයන් යෝජනා ක්‍රමයට බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගොවි විශ්‍රාම වැටුප් අති විශේෂ ගැසට් නිවේදනය පරිදි විශ්‍රාම වැටුප් ගෙව්වද මෙම යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු වාරිකය ඉහල අගයක් ගත් බැවින් නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස මණ්ඩලය වෙත උපදෙස් ලැබුණි. ඒ අනුව නව රජයේ ප්‍රතිපත්තියට අනුව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යූහ ගතකොට නව බඳවාගැනීම් හා වාරික මුදල් අයකිරීමේ නව ක්‍රමවේදයක් සකස් කිරීමට අපේක්ෂිතය. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුණ පරිදි සාමාජිකයන් අඛණ්ඩව බඳවාගැනීමට කටයුතු කල යුතුය. |
| 6 (1) වගන්තිය | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව විශ්‍රාම වැටුප සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබුණි. 2017 අප්‍රේල් සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා ගොවීන් 19,283 කට විශ්‍රාම වැටුප් හිඟ මුදල් එකතුව රු.451,324,111 ක් වී තිබුණු අතර එය ගෙවා නොතිබුණි. එසේම 2012 – 2013 කාල පරිච්ඡේදයට අදාළව ගොවීන් 90,573 කට හිමි හිඟ විශ්‍රාම වැටුප වන රු.3,033,329,200 ක මුදලද ගෙවා නොතිබුණි. | ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙම හිඟ මුදල භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් අනුව ඉදිරියේදී ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලබන අතර, ගෙවනු ලබන අවස්ථාවේදී එකී වගකීමෙන් ඉවත් කරනු ලැබේ. | හිඟයක් ඇති නොවන පරිදි අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කල යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බැංකු ගිණුම් 03 කට අදාලව 1992 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.1,179,624 ක් වටිනා චෙක්පත් 117 ක් සම්බන්ධයෙන් කරුණු සොයා බලා නිවැරිදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් වසර 15-25ක් අතර පැරණි ශේෂයන් වන අතර 2003 වර්ෂයේදී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කල හැකි සියළුම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කල අතර එසේ සොයා ගත නොහැකි වූ ශේෂයන් මෙලෙස ඉදිරියට ගෙනවිත් ඇත. මෙම තත්වයට බොහෝ විට හේතු වී ඇත්තේ එකම චෙක්පතට දෙවරක් රිසිට්පත් නිකුත් කිරීම වේ. මේ පිළිබඳව දිගින් දිගටම විගණන කමිටු වලදී හා මහා භාණ්ඩාගාරයේදී පැවති විශේෂ සාකච්ඡා වලදී කරුණු සොයා බැලීමෙන් පසුව, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එහි අනුමැතිය ලැබූ පසු ගිණුම් වලින් කපාහැරීමට බලාපොරොත්තු වේ. | එකම චෙක්පතට දෙවරක් රිසිට්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු සොයා බලා නිවැරිදි කිරීමට කටයුතු කල යුතුය. |

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2012 වර්ෂ අවසන් වනවිට යෝජනා ක්‍රමයේ සක්‍රීය ගොවීන් සංඛ්‍යාව 959,254 ක් වූ අතර, 2012 වර්ෂයෙන් පසු දායකයින් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම හේතුවෙන් සක්‍රීය සමාජික සංඛ්‍යාව, වාර්ෂිකව එකතුවිය යුතු දායකය හා ගෙවිය යුතු නිවැරදි විශ්‍රාම වැටුප් වටිනාකම කොපමණද යන්න ගණනය කිරීමට නොහැකි විය. | දායකයින් පිළිබඳ සියළු තොරතුරු පරිගණක ගත කරමින් පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වේ. | තොරතුරු පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 312,010,448 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 42,640,061 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.269,370,387ක පිරිහීමක් නිරීක්ෂණය විය. පිරිහීමට විශ්‍රාම වැටුප් ගෙවීම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වූ නව විශ්‍රාම යෝජනා ක්‍රමයේ ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුලත් කර පද්ධතිය යාවත්කාලීන කිරීමට ගොවි තොරතුරු සමීක්ෂණය සඳහා සහභාගි වූ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට දිරිදීමනා ගෙවීම, මුද්‍රණ වියදම් හා ප්‍රචාරණය වෙනුවෙන් රු.1,726,875 ක් වැය කර තිබුණද පද්ධතිය මෙතෙක් යාවත්කාලීන කර නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනේදී, තොරතුරු ඉදිරිපත් කර තිබූ ගොවීන්ගේ සංඛ්‍යාව අඩු අගයක් ගත්ත ද ලැබී ඇති තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. මණ්ඩලය අපේක්ෂා කල පරිදි ගොවීන් සමීක්ෂණයට නිසි පරිදි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා අදාල ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේදී මෙම තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ. | ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුලත් කර පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | 2018 වර්ෂය සඳහා පිළියෙල කරතිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (අ) | 1981 වර්ෂයේ සිට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාල ලිපිගොනු විශාල ප්‍රමාණයක් ඇති අතර, එයින් බොහොමයක් දිරාපත් වි ඇති නිසා ගොවීන්ගේ විශ්‍රාම වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය (document management system) මඟින් සුරක්ෂිත කිරීම. | මේ වන විට නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා ඇති බව දන්වමි. | ක්‍රියාකාරී සැලැස්ම පරිදි කටයුතු කල යුතුය. |
| (ආ) | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගොවීන් බඳවා ගැනීම. | නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස්කර විශේෂඥ කමිටුවකට යොමු කර උපදෙස් පරිදි ප්‍රතිව්‍යුහගත කොට නව බඳවා ගැනීම් සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ. | - එම - |